# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

**නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.**

**சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.**

**Independence Square, Colombo 07, Sri Lanka.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No — PA/PD/1/2/3/1 | ඔබේ අංකය / உமதுஇல / Your No — | දිනය / திகதி / Date — 2023-07-26 |

**සිහිකැඳවීමයි**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ප්‍රධානීන් වෙත

**ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායන් හා මාර්ග සිතියම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

උක්ත කරුණට අදාල 2023-05-14 දිනැති 8/2023 හා 2023-05-17 දිනැති 8/2023 (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

යථෝක්ත චක්‍රලේඛය මගින් උපදෙස් දී ඇති පරිදි ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායන් හා මාර්ග සිතියම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, කාර්යාල හෝ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල රාජ්‍ය සතු සමාගම් වෙතින් ඉල්ලා ඇති පහත සඳහන් තොරතුරු ඇතැම් ආයතන විසින් තවමත් එවා නොමැති බව නිරීක්ෂණය වේ.

01. බලශක්ති ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් කාර්යයන් හා කර්තව්‍යයන් අඩංගු කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන සැලසුම් (2023-05-31දිනට පෙර එවිය යුතු).

02. ඉහත බලශක්ති විභවයන් පරිභෝජනය නිසි අයුරින් සිදු කරන්නේ ද යන්න සොයා බැලීම සඳහා සෑම ආයතනයකටම බලශක්ති කළමනාකරුවෙකු වශයෙන් මාණ්ඩලික නිලධාරියෙකු පත් කිරීම.

03. 2022-06-30 සිට 2022-12-31 දක්වා ජලය, විදුලිය, ඉන්ධන හා දුරකථන පරිභෝජනය පිළිබඳ දත්ත වාර්තාවක් (මාසික ඒකක ගණන, 2023-06-30 දිනට පෙර එවිය යුතු).

ඉහත 03 හි දැක්වෙන දත්ත මාර්ග ගත දත්ත පද්ධතියක් හරහා ලබා ගැනීමට අවශ්‍ය නිර්මාණය මේ වන විට කරමින් පවතින බැවින් 01 හා 02 ට අදාල තොරතුරු මෙතෙක් එවා නොමැති සියලුම ආයතන වෙතින් 2023-08-07 දිනට පෙර අග්‍රාමාත්‍ය ලේකම්ට ද පිටපතක් සහිතව මාවෙත කඩිනමින් යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

කේ.ඩී.එන්. රංජිත් අශෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත: අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ. පි